පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතිය - 2022

-----------------------------------------------------------------

පරිසර පද්ධති සංරක්ෂණ හා කළමනාකරණ ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2016 සැප්තැම්බර් 05 දින එළඹි අංක 5792-එල්කේ දරන ණය ගිවිසුමේ 2(ආ)(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

ණය ගිවිසුම අනුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ශ්‍රී ලංකාවේ තෝරාගත් ස්ථානයන්හි සංරක්ෂණ අරමුණු හා ප්‍රජාවේ ප්‍රතිලාභ සඳහා පරිසර පද්ධති කළමනාකරණ තත්ත්ව වැඩිදියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. නියමු භූ දර්ශන සැලසුම් කිරීම හා කළමනාකරණය, ස්වාභාවික සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම හා අලි-මිනිස් සහජීවනය, රක්ෂිත ප්‍රදේශ කළමනාකරණය සහ ආයතනික ධාරිතා හා ව්‍යාපෘති කළමනාකරණය යන ප්‍රධාන සංරචක 04 ක් යටතේ මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 9,675 කට සමාන ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 45 ක් වූ අතර, මුළු මුදලම ජාත්‍යන්තර සංවර්ධන සංගමය මඟින් මූල්‍යායනය කිරීමට එකඟත්වය පළ කර ඇත. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2016 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර, 2022 ජූනි 30 දින වන විට එය නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය අවසන් කරන දිනය 2023 මැයි 31 දක්වා දීර්ඝ කර තිබුණ අතර සම්පූර්ණ ව්‍යාපෘති පිරිවැය රුපියල් මිලියන 7,630 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 35 ට නැවත වෙන් කර තිබුණි.

1.3 තත්ත්වාගණනය කළ මතය

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය යන කොටසේ විස්තර කර ඇති 2.1 වගුවේ දක්වා ඇති කරුණුවල බලපෑම හැර සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කර බව මා දරන්නා වූ මතය වේ.

1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | ගිණුම්කරණ දුර්වලතා | වටිනාකම (රු.) | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී පිළිවෙලින් දේපළ පිරියත හා උපකරණ සහ කෙරීගෙන යන වැඩ මිලදී ගැනීම වෙනුවෙන් රු.255,849,644 හා රු.865,194,268 වියදම් දැරුවද ලෙජර ගිණුම්වල ආරම්භක හා අවසාන ශේෂයන් රු.827,539,405 හා රු.275,714,065 ගැලපීමෙන් ආයෝජන ක්‍රියාකාරකම්වලින් ගලා ගිය මුදල ලබා ගෙන තිබූ බව නිරීක්ෂණය විය. | 1,121,043,912 | අදාළ ගිණුම් වර්ෂයේ හා පසුගිය ගිණුම් වර්ෂයේ වෙනස ගැලපීමෙන් මුදල් ප්‍රවාහය පෙරදී ලබා ගෙන තිබුණි. නමුත් දැන් අදාළ ගැළපුම් නිසි ලෙස සිදු කර මුදල් ප්‍රවාහය ලබා ගෙන ඇත. | මුදල් පිටතට ගලා යාම් නිසි ලෙස හඳුනා ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | දේපළ පිරියත හා උපකරණයන්හි අපහරණයන් නොතිබුණු අතර සටහනෙහි වටිනාකම රු.278,756,951 ක් වූ වත්කම් අපහරණය කර ඇති ලෙස පෙන්වා තිබුණි. | 278,756,951 | මෙම කරුණ නිවැරදි කිරීමට සුදුසු පියවර ගෙන ඇති අතර මෙවැනි අතපසුවීම් අනාගතයේදී සිදුවීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගනිමි. | දේපළ පිරියත හා උපකරණ සටහන මූල්‍ය ප්‍රකාශන තුළ නිවැරදිව හෙළිදරවු කළ යුතුය. |
| (ඇ) | සටහන් අංක 20 හි අනෙකුත් ක්‍රියාත්මක කරන ආයතනවලට අදාලව දේපළ පිරියත හා උපකරණයන්හි වටිනාකම රු.252,136,086 වුවද ඊට අනුරූපව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි වටිනාකම රු.266,513,092 ක් විය. ඒ අනුව රු.14,337,007 ක වෙනසක් නිරීක්ෂණය විය. | 14,337,007 | ගිණුම්කරණ පද්ධතියෙහි ආරම්භක ශේෂයන්හි සිදු වූ වරද හඳුනා ගත් අතර නිවැරදි කිරීමට පියවර ගනී. | ආරම්භක ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | අනෙකුත් ක්‍රියාත්මක කරන ආයතනවලට අදාළව රු.351,571,703 ක් කෙරීගෙන යන වැඩවලින් දේපළ පිරියත හා උපකරණ වෙත මාරු කර තිබුණද එය රු.348,158,269 ක් ලෙස ප්‍රාග්ධනිත කර තිබුණි. ඒ අනුව රු.3,413,434 ක වෙනසක් නිරීක්ෂණය විය. | 3,413,434 | අනෙකුත් ක්‍රියාත්මක කරන ආයතනවලට අදාලව සටහන් අංක 22 සිට 20 දක්වා නොනිමි වැඩ, දේපළ පිරියත හා උපකරණ වෙත මාරු කිරීමේදී අඩුවෙන් හඳුනාගෙන තිබුණු අතර නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. | නොනිමි වැඩ, සහ දේපළ පිරියත හා උපකරණ නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| ව්‍යාපෘති මෙහෙයුම් අත්පොතේ 4.2.5 ඡේදය | ස්ථාවර වත්කම් සත්‍යාපනය වාර්ෂිකව සිදු කළ යුතු වුවත් ESCAMP ව්‍යාපෘතියට අයත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වන සංරක්ෂණ දෙපාරතමේන්තුව විසින් භාවිතා කරනු ලබන වත්කම් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | ස්ථාවර වත්කම් සත්‍යාපනය දෙපාර්තමේන්තු විසින් සිදු කරනු ලබයි. | ස්ථාවර වත්කම් සත්‍යාපනය වාර්ෂිකව සිදු කළ යුතු අතර වත්කම්වල පැවැත්ම සහතික කළ යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති කාර්යයන් සම්පූර්ණ කිරීමේදී සිදු වූ ප්‍රමාදයන්

| | ක්‍රියාකාරකම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා රු.මිලියන 0.72 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ මොණරාගල දිස්ත්‍රික්කයේ රතුගල ප්‍රදේශයේ පවුල් ඒකක 105 ක ජීවන තත්ත්වය නඟා සිටුවීමේ ක්‍රියාකාරකම් 05 ක් අත්හැර දමා තිබුණු අතර රු.මිලියන 232.93 ක ප්‍රතිපාදන යටතේ නිම කිරීමට සැලසුම් කර තිබූ තවත් කාර්යයන් 09 ක් නිම කිරීමට නොහැකි වී තිබුණි. තවද උඩවලව ජාතික උද්‍යානය හරහා එක් පවුලක් සඳහා පර්චස් 80 ක බුලත් වගා කිරීමට පහසුකම් සැපයීමේ වැඩසටහන යටතේ රු.මිලියන 0.770 ක් වැය කර පවුල් ඒකක 14 ක් වෙත ලබා දී තිබුණු බුලත් පැළ රෝගයකට ගොදුරු වී අස්වැන්න ලබා ගැනීමට ප්‍රථම විනාශ වී තිබුණි. | සමහර ආදිවාසී නායකයින්ගේ අකමැත්ත හා කලාප අධ්‍යාපන කාර්යාලයෙන් නිර්දේශ ලබා ගැනීමට නොහැකි වීම මෙම අවසන් කිරීමට හේතු විය. | ව්‍යාපෘති අරමුණු අත්පත් කර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව පරිසර හිතකාමී සංචාරක කර්මාන්ත නගා සිටුවීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තම්න්තුව විසින් රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය හා කළමනාකරණය යටතේ රු.මිලියන 61.5 ක ප්‍රතිපාදන මඟින් නිම කිරීමට සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 07 ක භෞතික ප්‍රගතිය සියයට 32 ත් සියයට 65 ත් අතර විය. රු.මිලියන 10 ක ප්‍රතිපාදන යටතේ සිදුකරන ලද ඉදිකිරීම් කාර්යයන් දෙකක භෞතික ප්‍රගතිය සියයට 40 ක් වී තිබුණි. | පැවති ඉන්ධන අර්බුධය හා ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ඉහළ යාම හේතුවෙන් සිංහරාජ හා නකල්ස් හි සිදු කරන ලද ඉදි කිරීම් අවසන් කිරීමට සිදු වුවත් ව්‍යාපෘති කාල සීමාව තුල එම ඉදි කිරීම් සම්පූර්ණ කිරීමට ව්‍යාපෘති මෙහෙයුම් ඒකකය අවශ්‍ය පියවර ගෙන තිබේ. | ව්‍යාපෘති අරමුණු අත්පත් කර ගත යුතුය. |
| (ඇ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආයතනික ධාරිතාවය සංවර්ධනය කිරීම පිනිස ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ මූලික ඇස්තමේන්තුව රු. මිලියන 1,913 ක් වූ ව්‍යාපෘති 06 ක, කොන්ත්‍රාත් අත්හිටුවා 2023 දී රු.මිලියන 1,738 කට විෂය පථය අඩු කර තිබුණි. මැයි 31 වන විට අවසන් කිරීමට නව කොන්ත්‍රාත්කරුට පවරා තිබුණි. ඒ අනුව විෂය පථය අඩු කර නැවත පැවරීම මගින් මුළු පිරිවැය රුපියල් මිලියන 2,153.07 ක් වන අතර රුපියල් මිලියන.415.07 ක් ඇස්තමේන්තුගත මුදලට වඩා වැඩි බව නිරීක්ෂණය වේ. | පැවති ආර්ථික අර්බුධය, අමු ද්‍රව්‍යවල මිල ඉහළ යාම හා අමු ද්‍රව්‍ය හිඟය හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් ව්‍යාපෘති අතහැර දමා තිබුණි. මෙම හේතුව නිසා ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශයෙන් දුන් උපදෙස් පරිදි ව්‍යාපෘති මෙහෙයුම් ඒකකයට කටයුතු කිරීමට සිදු විය. | ව්‍යාපෘතිය නියමිත ව්‍යාපෘති කාලසීමාව තුල අවසන් කළ යුතුය. |

## 3.2 අනාර්ථික ගනුදෙනු

| ක්‍රියාකාරකම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 30 දෙනෙකු සඳහා කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (SLQF) 3 වන ස්ථරයට අයත් වනජීවී කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ 2017/2018 කණ්ඩායම සඳහා අයකළ පාඨමාලා ගාස්තුව රු.3,300,000 ක් වුවද, 2019/2020 කණ්ඩායම සඳහා ඊට වඩා රු.11,700,000 ක් වැඩියෙන් රු.15,000,000 ක ගාස්තුවක් අයකර තිබුණු අතර මෙම පාඨමාලාව සඳහා වැයකළ මුළු මුදල රු.38,819,579 ක් වීමෙන් එක් නිලධාරියෙකු වෙනුවෙන් වැයකළ මුදල රු.1,293,333ක් වී තිබුණි. එම විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද SLQF 8 වන ස්ථරයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ එක් සිසුවෙකුගේ ගාස්තුව රු.250,000 ක් වීමත්, කොළඹ විශ්ව විද්‍යාලය තෝරාගැනීමේදී ලෝක බැංකුවේ මෙහෙයුම් මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබීමත්, විශ්ව විද්‍යාලයට ගෙවූ රු.21,590,108කට අදාළ ඉන්වොයිසිවල මුල් පිටපත් හා රු.12,785,500 ක අත්තිකාරම් පියවීමට අදාළ වවුචර්වල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබීමත් යනාදී කරුණු අනුව ද මෙය අරපිරිමැසුම්දායි ගනුදෙනුවක් බවට නිරීක්ෂණය කළ නොහැකි විය. | ක්ෂේත්‍ර නිළධාරීන්ගේ ධාරිතාවය සංවර්ධනය කිරීම සඳහා ගිරිතලේ පිහිටි වනජීවී පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානයේ සැලසුම් කළ පරිදි පාඨමාලාව පැවැත්වීමට නොහැකි වීම හේතුවෙන් බලාපොරොත්තු නොවූ වියදම් දැරීමට සිදු වූ අතර ශ්‍රී ලංකාව පුරා පිහිටි රක්ෂිත ප්‍රදේශ තුල අධ්‍යනයන් රාශියක් පැවැත්වීමට සිදු විය. | විදේශ ණය සහාය මත සිදු කරන මෙවැනි කටයුතු ආර්ථික හා ඵලදායී අයුරින් සිදු කළ යුතුය. |